යම් කිසි පුවත් වාර්තාවක් කරුණු අතින් වැරදි බව පෙනී යන්නේ නම්, එය ප්‍රමුඛතාවක් ඇතිව සහ යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක් ඇතිව වහාම පළ කොට එය නිවැරදි කළ යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වේ.

ලංකාදීප (12/09) පුවත්පත මගින් "පොලිස් මූලස්ථානයේ 150 කට කොරෝනා" යන සිරස්තලයෙන් යුතුව මුල් පිටුවේ පුවත් වාර්තාවක් පළ කොට තිබිණි. එදිනම ඒ සම්බන්ධයෙන් ලිපියක් ලංකාදීප ප්‍රවෘත්ති කර්තෘට යොමු කරනා පොලිස් මූලස්ථානයේ පොලිස් මාධ්‍ය කොට්ඨාසය විසින් දක්වා සිටින්නේ, එම ලිපිය සම්පූර්ණයෙන්ම අසත්‍ය වන බවත්, පොලිස් මූලස්ථානයට අනුයුක්ත නිලධාරීන්ගෙන් කොවිඩ්-19 ආසාදිතව ප්‍රතිකාර ලබන්නේ නිලධාරීන් 3 දෙනෙකු පමණක් බවත් වේ. එසේම එම දෝෂ සහගත පුවත නිවැරදි කරන ලෙසින් වන ඉල්ලීමක්ද එහි වේ.

ඉන් පසු දින, එනම් අද දින (12/10) ලංකාදීප පුවත්පත මගින් මුල් පිටුවේම "පොලිස් මූලස්ථානයෙන් පැහැදිලි කිරීමක්" යන සිරස්තලයෙන් යුතුව නිවැරදි කිරීමක් පළ කරයි. එහි සඳහන් කෙරෙන්නේ, මහල් පහක පොලිස් මූලස්ථාන ගොඩනැගිල්ලේ පොලිස් දෙපාර්තමේන්තුවට අයත් තවත් අංශ ස්ථාපිත කර ඇති බවත්, ඉන් පෙර දින පුවතට පාදක වූයේ පොලිස් මූලස්ථාන ගොඩනැගිල්ල පිහිටි පරිශ්‍රයෙන් වාර්තා වී ඇති කොරෝනා ආසාදිත නිලධාරීන් සම්බන්ධ තොරතුරු බවත් වේ.

කරුණු අතින් අසත්‍ය වන හෝ දෝෂ සහගත වන පුවත් වාර්තාවක් පළ කිරීම නිරවද්‍යතාවය සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්මය කඩ කිරීමක් බව නොකිවමනායි. කෙසේ නමුත්, වහාම එය නිවැරදි කිරීමට පියවර ගැනීම ඉන් පසුව ගත හැකි ආචාර ධාර්මික පියවරයි. ලංකාදීප විසින් එම පියවර ගැනීමට කටයුතු කිරීම ප්‍රශංසා කටයුතුයි.

**#MediaEthicsSL #lka #SinhalaNews#Lankadeepa**